| 04 | ETC 02 | කර්මාන්ත තාක්ෂණිකයින් සඳහා වූ ජාතික සහතිකය (විදුලි ඉංජිනේරු)<br>(NVQ මට්ටම් 5)<br>පූර්ණ කාල දිවා - දෑවුරුදු (පදනම් පාඨමාලාවක් ද ඇතුළත්ය) | <u>**ඉංග්‍රීසි මාධ්‍යය**</u><br>මහනුවර<br>රත්මලාන | රජය පිළිගත් ඕනෑම වෘත්තීය පුහුණු ආයතනයක <u>**ක්ෂේත්‍රයට අදාළව**</u> NVQ මට්ටම් 3/4 පාඨමාලාවක් හදාරා සහතික ලබා තිබීම;<br>*හෝ*<br>අ.පො.ස. (උ.පෙළ) ඉංජිනේරු තාක්ෂණවේදය / ගණිත / විද්‍යා යන විෂයධාරාවන්ගෙන් අවම වශයෙන් විෂයයන් තුනක් සමත් වීම. |

## විදුලි, විද්‍යුත් හා විදුලි සංදේශ ක්ෂේත්‍රය

*අර්ධ කාල පාඨමාලා*

| *අනු. අංකය* | *පාඨමාලා සංකේත අංකය* | *පාඨමාලාවේ නම හා ස්වභාවය* | *පැවැත්වෙන තාක්ෂණ/ කාර්මික විද්‍යාලය* | *ඇතුළත්වීමේ සුදුසුකම් පූර්ණ කාලීන පාඨමාලා වයස අවුරුදු 17ත් 29ත් අතර විය යුතුය. අර්ධ කාලීන පාඨමාලා වයස අවුරුදු 17 ට වැඩි විය යුතුය.* |
|---|---|---|---|---|
| 05 | ETA 21.1 | විදුලි සංදේශ තාක්ෂණය පිළිබඳ ජාතික ඩිප්ලෝමාව<br>NVQ 5 සහ 6 මට්ටම් ඒකාබද්ධව පවතී.<br>සති අන්ත/අර්ධ කාල (NVQ Level-5/6 සඳහා නියමිත පැය ගණන)<br>(පදනම් පාඨමාලාවක්ද ඇතුළත්ය)<br>(This course Includes the use of Telecommunication Devices to Exchange Information by Electronic and Electrical Means Over a Significant distance) | <u>**ඉංග්‍රීසි මාධ්‍යය**</u><br>මරදන | ■ පරිගණක දෘඩාංග ශිල්පී<br>■ කර්මාන්ත විදුලි ශිල්පී<br>■ පරිගණක ජාලකරණ ශිල්පී<br>■ ගුවන් විදුලි යන්ත්‍ර හා රූපවාහිනී අළුත්වැඩියා කාර්මික ශිල්පී<br>ඉහත පාඨමාලාවලින් එකක් සඳහා NVQ මට්ටම 3/4 සහතික ලබා තිබීම; |

**මෙකාට්‍රොනික් ක්ෂේත්‍රය**

*පූර්ණ කාල පාඨමාලා*

| *අනු. අංකය* | *පාඨමාලා සංකේත අංකය* | *පාඨමාලාවේ නම හා ස්වභාවය* | *පැවැත්වෙන තාක්ෂණ/ කාර්මික විද්‍යාලය* | *ඇතුළත්වීමේ සුදුසුකම් පූර්ණ කාලීන පාඨමාලා වයස අවුරුදු 17ත් 29ත් අතර විය යුතුය. අර්ධ කාලීන පාඨමාලා වයස අවුරුදු 17 ට වැඩි විය යුතුය.* |
|---|---|---|---|---|
| 06 | ETB 04 | මෙකාට්‍රොනික් තාක්ෂණය පිළිබඳ ජාතික ඩිප්ලෝමාව<br><br>NVQ මට්ටම් 5<br><br>පූර්ණ කාල දිවා අවුරුදු 1 1/2<br><br>(පදනම් පාඨමාලාවක් ද ඇතුළත්ය.)<br><br>(This course includes the subjects related to Designing, Operating,Maintaining and Repairing Hydraulic, Pneumatic Electrical and Electronic Systems. Also include Robotic PLC, SCADA and Systems) | <u>**ඉංග්‍රීසි මාධ්‍යය**</u><br>මරදාන<br>ගාල්ල<br>ගම්පහ | ■ ගුවන් විදුලි යන්ත්‍ර හා රූපවාහිනී යන්ත්‍ර අළුත්වැඩියා කාර්මික ශිල්පී<br>■ පරිගණක දෘඩාංග ශිල්පී<br>■ විදුලි කාර්මික ශිල්පී<br>■ වායු කාර්මික ශිල්පී (Pneumatic Technician).<br>■ මෝටර් රථ කාර්මික ශිල්පී<br>■ මෝටර් රථ විදුලි කාර්මික ශිල්පී<br>■ ගෘහස්ථ විදුලි උපකරණ අළුත්වැඩියා කාර්මික ශිල්පී<br>■ වැද්දුම්කරු /යන්ත්‍ර ශිල්පී<br>ඉහත පාඨමාලාවලින් එකක් සඳහා NVQ මට්ටම් 3/4 සහතික ලබා තිබීම;<br>*හෝ*<br>අ.පො.ස.(උ.පෙළ) ඉංජිනේරු තාක්ෂණවේදය/ ගණිතය / විද්‍යාව යන විෂයධාරාවන්ගෙන් අවම වශයෙන් විෂයයන් තුනක් සමත් වීම. (උසස් පෙළ ඉංජිනේරු තාක්ෂණවේදය හැදෑරූ සිසුන් කෙරෙහි ප්‍රමුඛතාවය ලබාදෙනු ලැබේ.);<br>*හෝ*<br>කලා විෂය ධාරාවේ දෘඩ තාක්ෂණය (Hard Technology) යටතේ වූ විදුලි තාක්ෂණය (Electrical Technology),විද්‍යුත් තාක්ෂණය (Electronic Technology),තොරතුරු තාක්ෂණය (ICT) යන විෂයයන් අතුරින් එක් විෂයයක් සඳහා සම්මාන සාමාර්ථයක් සහිතව විෂයයන් තුනක් සමත්වීම. |
| 07 | ETB 29 | වායු හා ද්‍රව පීඩන තාක්ෂණය පිළිබඳ ජාතික ඩිප්ලෝමාව<br><br>National Diploma in Pneumatics and Hydraulics<br><br>**NVQ** මට්ටම් **5**<br><br>පූර්ණ කාල දිවා අවුරුදු 1 1/2<br><br>(පදනම් පාඨමාලාවක් ද ඇතුළත්ය.) | <u>**ඉංග්‍රීසි මාධ්‍යය**</u><br>ගම්පහ | ■ යන්ත්‍ර ශිල්පී<br>■ විදුලි කාර්මික ශිල්පී<br>■ මෝටර් රථ කාර්මික ශිල්පී<br>■ වායු කාර්මික ශිල්පී (Pneumatic Technician).<br><br>ඉහත පාඨමාලාවලින් එකක් සඳහා NVQ මට්ටම් 3/4 සහතික ලබා තිබීම;<br>*හෝ*<br>අ.පො.ස.(උ.පෙළ) ඉංජිනේරු තාක්ෂණවේදය / ගණිතය / විද්‍යාව යන විෂයධාරාවන්ගෙන් අවම වශයෙන් විෂයයන් තුනක් සමත් වීම. (උසස් පෙළ ඉංජිනේරු තාක්ෂණවේදය හැදෑරූ සිසුන් කෙරෙහි ප්‍රමුඛතාවය ලබාදෙනු ලැබේ.); |

| | | | | |
|---|---|---|---|---|
| 08 | ETB 30 | CNC තාක්ෂණය පිළිබඳ ජාතික ඩිප්ලෝමාව<br><br>National Diploma in CNC Technology (Computer Numerical Control)<br><br>NVQ මට්ටම් 5<br><br>පූර්ණ කාල දිවා අවුරුදු 1 1/2<br><br>(පදනම් පාඨමාලාවක්ද ඇතුලත්ය.) | <u>ඉංග්‍රීසි මාධ්‍යය</u><br>ගම්පහ | ■ යන්ත්‍ර ශිල්පී<br>■ ඇළුමිනියම් පිළිසකර කරන්නා,<br><br>ඉහත පාඨමාලාවලින් එකක් සඳහා NVQ මට්ටම් 3/4 සහතික ලබා තිබීම;<br>හෝ<br>අ.පො.ස.(උ.පෙළ) ඉංජිනේරු තාක්ෂණවේදය / ගණිතය / විද්‍යාව යන විෂයධාරාවන්ගෙන් අවම වශයෙන් විෂයයන් තුනක් සමත් වීම. (උසස් පෙළ ඉංජිනේරු තාක්ෂණවේදය හැදෑරූ සිසුන් කෙරෙහි ප්‍රමුඛතාවය ලබාදෙනු ලැබේ.); |

**මෙකාට්‍රොනික් ක්ෂේත්‍රය**

*අර්ධ කාල පාඨමාලා*

| *අනු. අංකය* | *පාඨමාලා සංකේත අංකය* | *පාඨමාලාවේ නම හා ස්වභාවය* | *පැවැත්වෙන තාක්ෂණ/ කාර්මික විද්‍යාලය* | *ඇතුළත්වීමේ සුදුසුකම්<br>පූර්ණ කාලීන පාඨමාලා<br>වයස අවුරුදු 17ත් 29ත් අතර විය යුතුය.<br>අර්ධ කාලීන පාඨමාලා<br>වයස අවුරුදු 17 ට වැඩි විය යුතුය.* |
|---|---|---|---|---|
| 09 | ETB 04.1 | මෙකාට්‍රොනික් තාක්ෂණය පිළිබඳ ජාතික ඩිප්ලෝමාව<br>NVQ මට්ටම් 5<br><br>සති අන්ත/අර්ධ කාල<br>(NVQ Level - 5 සඳහා නියමිත පැය ගණන)<br><br>(පදනම් පාඨමාලාවක්ද ඇතුළත්ය.)<br><br>(This course includes the subjects related to Designing, Operating, Maintaining and Repairing Hydraulic, Pneumatic Electrical and Electronic Systems. Also include Robotic PLC, SCADA and Systems) | <u>ඉංග්‍රීසි මාධ්‍ය</u><br>මරදාන<br>ගාල්ල | ➢ ගුවන් විදුලි යන්ත්‍ර හා රූපවාහිනී යන්ත්‍ර අළුත්වැඩියා කාර්මික ශිල්පී<br>➢ පරිගණක දෘඩාංග ශිල්පී<br>➢ විදුලි කාර්මික ශිල්පී<br>➢ වායු කාර්මික ශිල්පී (Pneumatic Technician)<br>➢ මෝටර් රථ කාර්මික ශිල්පී<br>➢ මෝටර් රථ විදුලි කාර්මික ශිල්පී<br>➢ ගෘහස්ථ විදුලි උපකරණ අළුත්වැඩියා කාර්මික ශිල්පී<br>➢ වෑද්දුම්කරු/යන්ත්‍ර ශිල්පී<br><br>ඉහත පාඨමාලාවලින් එකක් සඳහා NVQ මට්ටම් 3/4 සහතික ලබා තිබීම. |

**ගොඩනැගිලි ඉදිකිරීම් ක්ෂේත්‍රය**

*පූර්ණ කාල පාඨමාලා*

| *අනු. අංකය* | *පාඨමාලා සංකේත අංකය* | *පාඨමාලාවේ නම හා ස්වභාවය* | *පැවැත්වෙන තාක්ෂණ/ කාර්මික විද්‍යාලය* | *ඇතුලත්වීමේ සුදුසුකම් පූර්ණ කාලීන පාඨමාලා වයස අවුරුදු 17ත් 29ත් අතර විය යුතුය. අර්ධ කාලීන පාඨමාලා වයස අවුරුදු 17 ට වැඩි විය යුතුය.* |
|---|---|---|---|---|
| 10 | ETB 06 | ඉදිකිරීම් තාක්ෂණය පිළිබඳ ජාතික ඩිප්ලෝමාව<br><br>NVQ මට්ටම් 5<br><br>පූර්ණ කාල දිවා අවුරුදු 1 1/2<br><br>(පදනම් පාඨමාලාවක්ද ඇතුළත්ය.)<br><br>(This course includes the subjects related to Planning of Construction Works, Managing and Organizing Sites) | <u>**ඉංග්‍රීසි මාධ්‍යය**</u><br>බදුල්ල<br>කුරුණෑගල<br>අනුරාධපුර<br>ගාල්ල<br>රත්නපුර<br>යාපනය | ➢ගොඩනැගිලි ඉදිකිරීම් ශිල්පී (පෙදරේරු)<br>➢ලී වැඩ ශිල්පී(ඉදිකිරීම්)<br>➢ඉදිකිරීම් ක්ෂේත්‍ර පරීක්ෂක<br>➢ජලනල ශිල්පී<br>➢කර්මාන්ත ජලනල ශිල්පී<br>➢ගොඩනැගිලි පින්තාරු ශිල්පී<br>➢සැලසුම් ශිල්පී<br>➢සහකාර ප්‍රමාණ සමීක්ෂක<br><br>ඉහත පාඨමාලාවලින් එකක් සඳහා NVQ මට්ටම් 3/4 සහතික ලබා තිබීම;<br>*හෝ*<br>අ.පො.ස.(උ.පෙළ) ඉංජිනේරු තාක්ෂණවේදය/ ගණිතය / විද්‍යාව යන විෂයය ධාරාවන්ගෙන් අවම වශයෙන් විෂයයන් තුනක් සමත් වීම. (උසස් පෙළ ඉංජිනේරු තාක්ෂණවේදය හැදෑරූ සිසුන් කෙරෙහි ප්‍රමුඛතාවය ලබා දෙනු ලැබේ.);<br>*හෝ*<br>කලා විෂය ධාරාවේ දෘඪ තාක්ෂණය (Hard Technology) යටතේ වූ විදුලි තාක්ෂණය (Electrical Technology), විද්‍යුත් තාක්‍ෂණය (Electronic Technology), සිවිල් තාක්ෂණය (Civil Technology) යන විෂයයන් අතුරින් එක් විෂයයක් සඳහා සම්මාන සාමාර්ථයක් සහිතව විෂයයන් තුනක් සමත්වීම. |
| 11 | ETC 01 | කර්මාන්ත තාක්ෂණිකයින් සඳහා වූ ජාතික සහතිකය (සිවිල් ඉංජිනේරු)<br><br>NVQ මට්ටම් 5<br><br>පූර්ණ කාල දිවා - දෑවුරුදු (පදනම් පාඨමාලාවක්ද ඇතුළත්ය) | <u>**ඉංග්‍රීසි මාධ්‍යය**</u><br>මහනුවර<br>රත්මලාන<br>කුලියාපිටිය | රජය පිළිගත් ඕනෑම වෘත්තීය පුහුණු ආයතනයක <u>ක්ෂේත්‍රයට අදාළව</u> NVQ මට්ටම් 3/4 පාඨමාලාවක් හදාරා සහතික ලබා තිබීම;<br>*හෝ*<br>අ.පො.ස. (උ.පෙළ) ඉංජිනේරු තාක්ෂණවේදය / ගණිතය / විද්‍යාව යන විෂයධාරාවන්ගෙන් අවම වශයෙන් විෂයයන් තුනක් සමත් වීම. |

| අනු. අංකය | පාඨමාලා සංකේත අංකය | පාඨමාලාවේ නම හා ස්වභාවය | පැවැත්වෙන තාක්ෂණ/ කාර්මික විද්‍යාලය | ඇතුලත්වීමේ සුදුසුකම් පූර්ණ කාලීන පාඨමාලා වයස අවුරුදු 17ත් 29ත් අතර විය යුතුය. අර්ධ කාලීන පාඨමාලා වයස අවුරුදු 17 ට වැඩි විය යුතුය. |
|---|---|---|---|---|
| 12 | ETB 17 | ප්‍රමාණ සමීක්ෂණ තාක්ෂණය පිළිබඳ ජාතික ඩිප්ලෝමාව<br><br>**NVQ** මට්ටම් **5**<br><br>පූර්ණ කාල දිවා අවුරුදු 1 1/2<br><br>(පදනම් පාඨමාලාවක් ද ඇතුළත්ය.)<br><br>(This course includes mathematical processes used in estimating cost of a new building construction, improvement, or reproduction.) | <u>**ඉංග්‍රීසි මාධ්‍යය**</u><br>අම්පාර<br>අනුරාධපුර<br>බදුල්ල<br>ගාල්ල<br>යාපනය<br>මහනුවර<br>කුරුණෑගල<br>මරදන<br>රත්නපුර<br>බලපිටිය<br>බෙලිඅත්ත<br>ගම්පහ<br>හෝමාගම<br>කළුතර<br>කෑගල්ල<br>කුලියාපිටිය<br>මාතර<br>මාතලේ<br>මඩකලපුව<br>සම්මන්තුරේ | ➢ ඉංජිනේරු සැලසුම් ශිල්පය පිළිබඳ ජාතික සහතිකය<br>➢ ගොඩනැගිලි ඉදිකිරීම් ශිල්පී (පෙදරේරු)<br>➢ ඉදිකිරීම් ක්ෂේත්‍ර පරීක්ෂක<br>➢ සහකාර ප්‍රමාණ සමීක්ෂක<br>➢ ජලනල ශිල්පී<br>➢ කර්මාන්ත ජලනල ශිල්පී<br>➢ ගොඩනැගිලි සේවා තාක්ෂණික ශිල්පී<br><br>ඉහත පාඨමාලාවලින් එකක් සඳහා NVQ මට්ටම් 3/4 සහතික ලබා තිබීම,<br>*හෝ*<br>අ.පො.ස. (උ.පෙළ) තාක්ෂණවේදය/ ගණිතය/විද්‍යාව යන විෂය ධාරාවන්ගෙන් අවම වශයෙන් විෂයයන් තුනක් සමත් වීම. (උසස් පෙළ තාක්ෂණවේදය හැදෑරූ සිසුන් කෙරෙහි ප්‍රමුඛතාවය ලබා දෙනු ලැබේ.)<br>*හෝ*<br>කලා විෂයය ධාරාවේ දෘඪ තාක්ෂණය (Hard Technology) යටතේ වූ සිවිල් තාක්ෂණය (Civil Technology) විෂයයට සම්මාන සාමාර්ථයක් සහිතව විෂයයන් තුනක් (03) සමත්වීම. |
| 13 | ETB 20 | ගොඩනැගිලි සේවා තාක්ෂණය පිළිබඳ ජාතික ඩිප්ලෝමාව<br><br>NVQ මට්ටම් 5<br><br>පූර්ණකාල දිවා අවුරුදු 1 1/2<br><br>(පදනම් පාඨමාලාවක්ද ඇතුලත්ය.) | <u>**ඉංග්‍රීසි මාධ්‍යය**</u><br><br>මරදන | ➢ ගොඩනැගිලි ඉදිකිරීම් ශිල්පී (පෙදරේරු)<br>➢ ලී වැඩ ශිල්පී(ඉදිකිරීම්)<br>➢ ඉදිකිරීම් ක්ෂේත්‍ර පරීක්ෂක<br>➢ ජලනල ශිල්පී<br>➢ කර්මාන්ත ජලනල ශිල්පී<br>➢ ගොඩනැගිලි පින්තාරු ශිල්පී<br>➢ සැලසුම් ශිල්පී<br>➢ සහකාර ප්‍රමාණ සමීක්ෂක<br>➢ විදුලි කාර්මික ශිල්පී<br>➢ කර්මාන්ත විදුලි ශිල්පී<br>ඉහත පාඨමාලාවලින් එකක් සඳහා NVQ මට්ටම් 3/4 සහතික ලබා තිබීම;<br>*හෝ*<br>අ.පො.ස.(උ.පෙළ) ඉංජිනේරු තාක්ෂණවේදය/ ගණිත / විද්‍යා යන විෂයධාරාවන්ගෙන් අවම වශයෙන් විෂයයන් තුනක් සමත් වීම. (උසස් පෙළ ඉංජිනේරු තාක්ෂණවේදය හැදෑරූ සිසුන් කෙරෙහි ප්‍රමුඛතාවය ලබා දෙනු ලැබේ.)<br>*හෝ*<br>කලා විෂයය ධාරාවේ දෘඪ තාක්ෂණය (**Hard Technology**) යටතේ වූ සිවිල් තාක්ෂණය (**Civil Technology**) විෂය සඳහා සම්මාන සාමාර්ථයක් සහිතව විෂයයන් තුනක් සමත්වීම. |

| | | | | |
|---|---|---|---|---|
| 14 | ETB 27 | සැලසුම් ශිල්පය පිළිබඳ ජාතික ඩිප්ලෝමාව (ගොඩනැගිලි)<br><br>NVQ මට්ටම 5<br><br>පූර්ණකාල දිවා අවුරුදු 1 1/2<br><br>(පදනම් පාඨමාලාවක්ද ඇතුලත්ය.)<br><br>(This course includes basic drawing concepts, drawings using drafting software, construction detail drawings, architectural detail drawings, setting out and leveling) | **<u>ඉංග්‍රීසි මාධ්‍යය</u>**<br>කුරුණෑගල | අවුරුදු දෙකක පළපුරුද්ද සමග ඉංජිනේරු සැලසුම් ශිල්පය පිළිබඳ සහතිකය NVQ මට්ටම් 3 පාඨමාලාවක් හදාරා සහතික ලබා තිබීම;<br>*හෝ*<br>සැලසුම් ශිල්පය පිළිබඳ සහතිකය NVQ මට්ටම් 4 පාඨමාලාවක් හදාරා සහතික ලබා තිබීම. |

**ගොඩනැගිලි ඉදිකිරීම් ක්ෂේත්‍රය**

*අර්ධ කාල පාඨමාලා*

| *අනු අංකය* | *පාඨමාලා සංකේත අංකය* | *පාඨමාලාවේ නම හා ස්වභාවය* | *පැවැත්වෙන තාක්ෂණ/ කාර්මික විද්‍යාලය* | *ඇතුලත්වීමේ සුදුසුකම් පූර්ණ කාලීන පාඨමාලා වයස අවුරුදු 17ත් 29ත් අතර විය යුතුය. අර්ධ කාලීන පාඨමාලා වයස අවුරුදු 17 ට වැඩි විය යුතුය.* |
|---|---|---|---|---|
| 15 | ETB 06.1 | ඉදිකිරීම් තාක්ෂණය පිළිබඳ ජාතික ඩිප්ලෝමාව<br><br>**NVQ** මට්ටම **5**<br><br>සති අන්ත/අර්ධ කාල (NVQ Level - 5 සඳහා නියමිත පැය ගණන)<br><br>(පදනම් පාඨමාලාවක්ද ඇතුළත්ය.)<br><br>(This course includes the subjects related to Planning of Construction Works, Managing and Organizing Sites) | **<u>ඉංග්‍රීසි මාධ්‍යය</u>**<br>අම්පාර<br>අනුරාධපුර<br>ගාල්ල<br>යාපනය<br>කුරුණෑගල<br>රත්නපුර | ➢ගොඩනැගිලි ඉදිකිරීම් ශිල්පී (පෙදරේරු)<br>➢ලී වැඩ ශිල්පී (ඉදිකිරීම්)<br>➢ඉදිකිරීම් ක්ෂේත්‍ර පරීක්ෂක<br>➢ජලනල ශිල්පී<br>➢කර්මාන්ත ජලනල ශිල්පී<br>➢ගොඩනැගිලි පින්තාරු ශිල්පී<br>➢සැලසුම් ශිල්පී<br>➢සහකාර ප්‍රමාණ සමීක්ෂක<br>ඉහත පාඨමාලාවලින් එකක් සඳහා NVQ මට්ටම් 3/4 සහතික ලබා තිබීම |
| 16 | ETA 06.1 | ඉදිකිරීම් තාක්ෂණය පිළිබඳ ජාතික ඩිප්ලෝමාව<br><br>**NVQ** මට්ටම **6**<br><br>සති අන්ත/අර්ධ කාල (NVQ Level - 6 සඳහා නියමිත පැය ගණන)<br><br>(පදනම් පාඨමාලාවක්ද ඇතුළත්ය.) | **<u>ඉංග්‍රීසි මාධ්‍යය</u>**<br>කුරුණෑගල | ඉදිකිරීම් තාක්ෂණය පිළිබඳ NVQ මට්ටම් 5 පාඨමාලාවක් හදරා සහතික ලබා තිබීම |

| | | | | |
|---|---|---|---|---|
| 17 | ETB 17.1 | ප්‍රමාණ සමීක්ෂණ තාක්ෂණය පිළිබඳ ජාතික ඩිප්ලෝමාව<br><br>NVQ මට්ටම් 5<br><br>සති අන්ත/අර්ධ කාල (NVQ Level - 5 සඳහා නියමිත පැය ගණන)<br><br>(පදනම් පාඨමාලාවක් ද ඇතුළත්ය).<br><br>(This course includes mathematical processes used in estimating cost of a new building construction, improvement, or reproduction.) | <u>ඉංග්‍රීසි මාධ්‍යය</u><br>ගාල්ල<br>රත්මලාන | ➢ ඉංජිනේරු සැලසුම් ශිල්පය පිළිබඳ ජාතික සහතිකය<br>➢ ගොඩනැගිලි ඉදිකිරීම් ශිල්පී (පෙදරේරු)<br>➢ ලී වැඩ ශිල්පී (ඉදිකිරීම්)<br>➢ ඉදිකිරීම් ක්ෂේත්‍ර පරීක්ෂක<br>➢ ජලනල ශිල්පී<br>➢ කර්මාන්ත ජලනල ශිල්පී<br>➢ සහකාර ප්‍රමාණ සමීක්ෂණ<br>➢ ගොඩනැගිලි සේවා තාක්ෂණික ශිල්පී<br><br>ඉහත පාඨමාලාවලින් එකක් සඳහා NVQ මට්ටම් 3/4 සහතික ලබා තිබීම. |
| 18 | ETB 27.1 | සැලසුම් ශිල්පය පිළිබඳ ජාතික ඩිප්ලෝමාව (ගොඩනැගිලි)<br>NVQ මට්ටම් 5<br><br>සති අන්ත/අර්ධ කාල (NVQ Level - 5 සඳහා නියමිත පැය ගණන)<br><br>(පදනම් පාඨමාලාවක්ද ඇතුළත්ය.)<br><br>(This course includes basic drawing concepts, drawings using drafting software, construction detail drawings, architectural detail drawings, setting out and leveling) | <u>ඉංග්‍රීසි මාධ්‍යය</u><br>රත්මලාන | අවුරුදු දෙකක පළපුරුද්ද සමග ඉංජිනේරු සැලසුම් ශිල්පය පිළිබඳ සහතිකය NVQ මට්ටම් 3 පාඨමාලාවක් හදාරා සහතික ලබා තිබීම;<br>*හෝ*<br>සැලසුම් ශිල්පය පිළිබඳ සහතිකය NVQ මට්ටම් 4 පාඨමාලාවක් හදාරා සහතික ලබා තිබීම. |

**මෝටර් වාහන අළුත්වැඩියාව හා නඩත්තු ක්ෂේත්‍රය**

*පූර්ණ කාල පාඨමාලා*

| *අනු. අංකය* | *පාඨමාලා සංකේත අංකය* | *පාඨමාලාවේ නම හා ස්වභාවය* | *පැවැත්වෙන තාක්ෂණ/ කාර්මික විද්‍යාලය* | *ඇතුලත්වීමේ සුදුසුකම් පූර්ණ කාලීන පාඨමාලා වයස අවුරුදු 17ත් 29ත් අතර විය යුතුය. අර්ධ කාලීන පාඨමාලා වයස අවුරුදු 17 ට වැඩි විය යුතුය.* |
|---|---|---|---|---|
| 19 | ETB 07 | මෝටර් රථ තාක්ෂණය පිළිබඳ ජාතික ඩිප්ලෝමාව<br><br>NVQ මට්ටම් 5<br><br>පූර්ණකාල දිවා අවුරුදු 1 1/2<br><br>(පදනම් පාඨමාලාවක්ද ඇතුලත්ය.) | <u>ඉංග්‍රීසි මාධ්‍යය</u><br>අම්පාර<br>මහනුවර<br>කුරුණෑගල<br>මරදන<br>බදුල්ල<br>මාතර | ➢ මෝටර් රථ කාර්මික ශිල්පී<br>➢ මෝටර් රථ කාර්මික විදුලි ශිල්පී<br>➢ මෝටර් රථ පින්තාරුකරු<br>➢ මෝටර් සයිකල් සහ ත්‍රි රෝද රථ කාර්මික<br>➢ ත්‍රි රෝද රථ කාර්මික |

| | | | | |
|---|---|---|---|---|
| | | (This course includes study on proper functioning and maintenance of automobile, two stroke and four stroke engine operating systems and other sub systems related to them) | | ඉහත පාඨමාලාවලින් එකක් සඳහා NVQ මට්ටම් 3/4 සහතික ලබා තිබීම;<br>හෝ<br>අ.පො.ස.(උ.පෙළ) ඉංජිනේරු තාක්ෂණවේදය /ගණිත/ විද්‍යා යන විෂයධාරාවන්ගෙන් අවම වශයෙන් විෂයයන් තුනක් සමත් වීම. (උසස් පෙළ ඉංජිනේරු තාක්ෂණවේදය හැදෑරූ සිසුන් කෙරෙහි ප්‍රමුඛතාවය ලබා දෙනු ලැබේ.);<br>හෝ<br>කලා විෂය ධාරාවේ දෘඩ තාක්ෂණය (Hard Technology) යටතේ වූ යාන්ත්‍රික තාක්ෂණය (Mechanical Technology) විෂය සඳහා සම්මාන සාමාර්ථයක් සහිතව විෂයයන් තුනක් සමත්වීම. |

**මෝටර් වාහන අළුත්වැඩියාව හා නඩත්තු ක්ෂේත්‍රය**

*අර්ධ කාල පාඨමාලා*

| *අනු. අංකය* | *පාඨමාලා සංකේත අංකය* | *පාඨමාලාවේ නම හා ස්වභාවය* | *පැවැත්වෙන තාක්ෂණ/ කාර්මික විද්‍යාලය* | *ඇතුලත්වීමේ සුදුසුකම් පූර්ණ කාලීන පාඨමාලා වයස අවුරුදු 17ත් 29ත් අතර විය යුතුය. අර්ධ කාලීන පාඨමාලා වයස අවුරුදු 17 ට වැඩි විය යුතුය.* |
|---|---|---|---|---|
| **20** | ETB 07.1 | මෝටර් රථ තාක්ෂණය පිළිබඳ ජාතික ඩිප්ලෝමාව<br><br>NVQ මට්ටම් 5<br><br>සති අන්ත/අර්ධ කාල (NVQ Level - 5 සඳහා නියමිත පැය ගණන)<br><br>(පදනම් පාඨමාලාවක් ද ඇතුලත්ය).<br><br>(This course includes study on proper functioning and maintenance of automobile two stroke and four stroke engine operating systems and other sub systems related to them.) | **ඉංග්‍රීසි මාධ්‍යය**<br>යාපනය<br>මරදාන<br>බණ්ඩාරවෙල<br>ගම්පහ | ➢ මෝටර් රථ කාර්මික ශිල්පී<br>➢ මෝටර් රථ කාර්මික විදුලි ශිල්පී<br>➢ මෝටර් රථ පින්තාරුකරු<br>➢ මෝටර් සයිකල් සහ ත්‍රී රෝද රථ කාර්මික<br>➢ ත්‍රී රෝද රථ කාර්මික<br><br>ඉහත පාඨමාලාවලින් එකක් සඳහා **NVQ** මට්ටම් 3/4 සහතික ලබා තිබීම. |

**ශීතකරණ හා වායුසමන ක්ෂේත්‍රය**

*පූර්ණ කාල පාඨමාලා*

| අනු. අංකය | පාඨමාලා සංකේත අංකය | පාඨමාලාවේ නම හා ස්වභාවය | පැවැත්වෙන තාක්ෂණ/ කාර්මික විද්‍යාලය | *ඇතුලත්වීමේ සුදුසුකම් පූර්ණ කාලීන පාඨමාලා වයස අවුරුදු 17ත් 29ත් අතර විය යුතුය. අර්ධ කාලීන පාඨමාලා වයස අවුරුදු 17 ට වැඩි විය යුතුය.* |
|---|---|---|---|---|
| 21 | ETB 08 | ශීතකරණ හා වායු සමන තාක්ෂණය පිළිබඳ ජාතික ඩිප්ලෝමාව<br><br>**NVQ** මට්ටම් **5**<br><br>පූර්ණ කාල දිවා අවුරුදු 1 1/2<br><br>(පදනම් පාඨමාලාවක් ද ඇතුළත්ය.)<br><br>(This course includes techniques applied for developing more comfortable conditions to improve thermal comfort and indoor air quality) | **ඉංග්‍රීසි මාධ්‍යය**<br>අනුරාධපුර<br>රත්නපුර<br>මහනුවර<br>ගම්පහ<br>කළුතර | ➢ ශීතකරණ හා වායුසමන කාර්මික ශිල්පී<br>➢මෝටර් රථ වායුසමන ශිල්පී<br>➢මෝටර් රථ විදුලි කාර්මික ශිල්පී<br>➢ ගෘහස්ථ විදුලි උපකරණ අළුත්වැඩියා කාර්මික ශිල්පී<br>➢ විදුලි කාර්මික ශිල්පී<br><br>ඉහත පාඨමාලාවලින් එකක් සඳහා NVQ මට්ටම් 3/4 සහතික ලබා තිබීම;<br>හෝ<br>අ.පො.ස.(උ.පෙළ) ඉංජිනේරු තාක්ෂණවේදය /ගණිතය / විද්‍යාව යන විෂයධාරාවන්ගෙන් අවම වශයෙන් විෂයන් තුනක් සමත් වීම. (උසස් පෙළ ඉංජිනේරු තාක්ෂණවේදය හැදෑරූ සිසුන් කෙරෙහි ප්‍රමුඛතාවය ලබා දෙනු ලැබේ.);<br>හෝ<br>කලා විෂය ධාරාවේ දෘඩ තාක්ෂණය (Hard Technology) යටතේ වූ විදුලි තාක්ෂණය (Electrical Technology),විද්‍යුත් තාක්ෂණය (Electronic Technology) යන විෂයන් අතුරින් එක් විෂයක් සඳහා සම්මාන සමාර්ථයක් සහිතව විෂයන් තුනක් සමත්වීම. |

**කෘෂිකාර්මික වගාවන් හා පශු සම්පත් ක්ෂේත්‍රය**

*පූර්ණ කාල පාඨමාලා*

| අනු. අංකය | පාඨමාලා සංකේත අංකය | පාඨමාලාවේ නම හා ස්වභාවය | පැවැත්වෙන තාක්ෂණ/ කාර්මික විද්‍යාලය | *ඇතුලත්වීමේ සුදුසුකම් පූර්ණ කාලීන පාඨමාලා වයස අවුරුදු 17ත් 29ත් අතර විය යුතුය. අර්ධ කාලීන පාඨමාලා වයස අවුරුදු 17 ට වැඩි විය යුතුය.* |
|---|---|---|---|---|
| 22 | ETA 19 | කෘෂි නිෂ්පාදන තාක්ෂණය පිළිබඳ ජාතික ඩිප්ලෝමාව<br><br>**NVQ** 5 සහ **6** මට්ටම් ඒකාබද්ධව පවතී.<br><br>පූර්ණ කාල දිවා අවුරුදු 2 1/2 | **ඉංග්‍රීසි මාධ්‍යය**<br>කුලියාපිටිය<br>සම්මන්තුරේ<br>දඹුල්ල | ➢පැළතවාන් සංවර්ධන සහකාර<br>➢ක්ෂේත්‍ර සහකාර (කෘෂිකර්ම);<br>හෝ<br>➢අ.පො.ස (සා.පෙළ) විභාගයේ කෘෂි කර්මය ඇතුළු විෂයයන් හයකින් (06) එක් වරකදී සමත්වීම, සහ පහත සඳහන් විෂයයන්ගෙන් හතරක් (04) සඳහා සම්මාන සාමාර්ථ ලබා තිබිය යුතුය. පළමු භාෂාව,ගණිතය, විද්‍යාව සහ සමාජ අධ්‍යයනය; හෝ |

| | | | | |
|---|---|---|---|---|
| | | (පදනම් පාඨමාලාවක් ද ඇතුළත්ය.)<br><br>(This course includes nursery farm, establishment Activities, primary processing of livestock, production, Agricultural products and Agronomic practices of plantation crops, field crops.) | | කෘෂිකර්මය, උද්‍යාන විද්‍යාව, සත්ත්ව පාලනය, ආහාර තාක්ෂණය, මිරිදිය ජීව සම්පත් තාක්ෂණය, සමුද්‍ර ජීව සම්පත් තාක්ෂණය යන විෂයන්ගෙන් එකක් ඇතුළුව;<br><br>හෝ<br>➢අ.පො.ස.(උ.පෙළ) තාක්ෂණවේදය / විද්‍යාව යන විෂයධාරාවන්ගෙන් අවම වශයෙන් විෂයයන් තුනක් (03) සමත් වීම. (උසස් පෙළ තාක්ෂණවේදය විෂය ධාරාවේ කෘෂිකර්මය විෂය හැදෑරූ සිසුන් කෙරෙහි ප්‍රමුඛතාවය ලබා දෙනු ලැබේ.)<br>හෝ<br>කලා විෂය ධාරාවේ මෘදු තාක්ෂණය (Soft Technology) යටතේ වූ කෘෂි තාක්ෂණය (Agro Technology) හෝ දෘඩ තාක්ෂණය (Hard Technology) යටතේ වූ යාන්ත්‍රික තාක්ෂණය (Mechanical Technology) යන විෂයයන්ගෙන් එක් විෂයයක් සඳහා සම්මාන සමාර්ථයක් සහිතව විෂයන් තුනක් (03) සමත්වීම. |
| 23 | ETB 09 | ගොවි යන්ත්‍රෝපකරණ තාක්ෂණය පිළිබඳ ජාතික ඩිප්ලෝමාව<br><br>**NVQ** මට්ටම් **5**<br><br>පූර්ණ කාල දිවා අවුරුදු 1 1/2<br><br>(පදනම් පාඨමාලාවක්ද ඇතුළත්ය.)<br><br>(This course includes selection, operation, utilization, and maintenance of machinery and mechanical devices related to agricultural activities) | **ඉංග්‍රීසි මාධ්‍යය**<br><br>අනුරාධපුර | ➢තේ කර්මාන්ත ශාලා යාන්ත්‍රික ශිල්පී<br>➢කෘෂි උපකරණ අළුත්වැඩියා කාර්මික ශිල්පී<br>➢ මෝටර් රථ කාර්මික ශිල්පී<br>➢යන්ත්‍ර ශිල්පී<br>➢ ඉදිකිරීම් යන්ත්‍රෝපකරණ අළුත්වැඩියා කාර්මික ශිල්පී<br>➢ ක්ෂේත්‍ර සහකාර (කෘෂිකර්ම)<br>ඉහත පාඨමාලාවලින් එකක් සඳහා NVQ මට්ටම් 3/4 සහතික ලබා තිබීම;<br>හෝ<br>අ.පො.ස.(උ.පෙළ) ඉංජිනේරු තාක්ෂණවේදය /ගණිතය / විද්‍යාව යන විෂයධාරාවන්ගෙන් අවම වශයෙන් විෂයන් තුනක් සමත් වීම. (උසස් පෙළ ඉංජිනේරු තාක්ෂණවේදය හැදෑරූ සිසුන් කෙරෙහි ප්‍රමුඛතාවය ලබා දෙනු ලැබේ.);<br>හෝ<br>කලා විෂය ධාරාවේ මෘදු තාක්ෂණය ( Soft Technology) යටතේ වූ කෘෂි තාක්ෂණය - (Agro Technology) හෝ දෘඩ තාක්ෂණය (Hard Technology) යටතේ වූ යාන්ත්‍රික තාක්ෂණය (Mechanical Technology) යන විෂයන් ගෙන් එක් විෂයක් සඳහා සම්මාන සාමාර්ථයක් සහිතව විෂයන් තුනක් (03) සමත්වීම. |

| | | | | |
|---|---|---|---|---|
| 24 | ETB 26 | පසු අස්වනු තාක්ෂණය පිළිබඳ ඩිප්ලෝමාව<br><br>**NVQ** මට්ටම් **5**<br><br>පූර්ණ කාල දිවා අවුරුදු 1 1/2<br><br>(පදනම් පාඨමාලාවක් ද ඇතුලත්ය.)<br><br>(This course includes activities related to post - harvesting machinery & equipment, Manage storage & transport, crop harvesting, crop processing ) | <u>**ඉංග්‍රීසි මාධ්‍යය**</u><br>අනුරාධපුරය | ➢පැළතවාන් සංවර්ධන සහකාර<br>➢ක්ෂේත්‍ර සහකාර (කෘෂිකර්ම)<br><br>හෝ<br><br>අ.පො.ස (සා.පෙළ) විභාගයේ කෘෂි කර්මය ඇතුළු විෂයයන් හයකින් (06) එක් වරකදී සමත්වීම, සහ පහත සඳහන් විෂයයන්ගෙන් හතරක් (04) සඳහා සම්මාන සමාර්ථ ලබා තිබිය යුතුය. පළමු භාෂාව,ගණිතය, විද්‍යාව සහ සමාජ අධ්‍යයනය හෝ<br>කෘෂිකර්මය, උද්‍යාන විද්‍යාව, සත්ත්ව පාලනය, ආහාර තාක්ෂණය, මිරිදිය ජීව සම්පත් තාක්ෂණය, සමුද්‍ර ජීව සම්පත් තාක්ෂණය යන විෂයන්ගෙන් එකක් ඇතුළුව;<br><br>හෝ<br>➢අ.පො.ස.(උ.පෙළ) තාක්ෂණවේදය / විද්‍යාව යන විෂයධාරාවන්ගේ අවම වශයෙන් විෂයයන් තුනක් (03) සමත් වීම. (උසස් පෙළ තාක්ෂණවේදය විෂය ධාරාවේ කෘෂිකර්මය විෂය හැදෑරූ සිසුන් කෙරෙහි ප්‍රමුඛතාවය ලබා දෙනු ලැබේ.);<br>හෝ<br>කලා විෂය ධාරාවේ මෘදු තාක්ෂණය (Soft Technology) යටතේ වූ කෘෂි තාක්ෂණය (Agro Technology) හෝ දෘඩ තාක්ෂණය (Hard Technology) යටතේ වූ යාන්ත්‍රික තාක්ෂණය (Mechanical Technology) යන විෂයයන්ගෙන් එක් විෂයයක් සඳහා සම්මාන සමාර්ථයක් සහිතව විෂයන් තුනක් (03) සමත්වීම. |

**තොරතුරු සන්නිවේදන හා බහුමාධ්‍ය තාක්‍ෂණ ක්ෂේත්‍රය**

*පූර්ණ කාල පාඨමාලා*

| *අනු. අංකය* | *පාඨමාලා සංකේත අංකය* | *පාඨමාලාවේ නම හා ස්වභාවය* | *පැවැත්වෙන තාක්ෂණ/ කාර්මික විද්‍යාලය* | *ඇතුලත්වීමේ සුදුසුකම් පූර්ණ කාලීන පාඨමාලා වයස අවුරුදු 17ත් 29ත් අතර විය යුතුය. අර්ධ කාලීන පාඨමාලා වයස අවුරුදු 17 ට වැඩි විය යුතුය.* |
|---|---|---|---|---|
| 25 | ETB 11 | තොරතුරු සහ සන්නිවේදන තාක්‍ෂණය පිළිබඳ ජාතික ඩිප්ලෝමාව<br><br>**NVQ** මට්ටම් **5**<br><br>පූර්ණ කාල දිවා අවුරුදු 1 1/2<br><br>(පදනම් පාඨමාලාවක්ද ඇතුළත්ය.) | **<u>ඉංග්‍රීසි මාධ්‍යය</u>**<br><br>අම්පාර<br>අනුරාධපුර<br>බදුල්ල<br>ගාල්ල<br>යාපනය<br>මහනුවර<br>කුරුණෑගල<br>මරදාන<br>රත්නපුර<br>කෑගල්ල<br>මාතලේ<br>වවුනියාව | ■ තොරතුරු සන්නිවේදන තාක්ෂණ ශිල්පී<br>■ පරිගණක යෙදවුම් සහායක<br>■ පරිගණක"ග්‍රැෆික්ඩිසයින්" ශිල්පී<br>■ පරිගණක දෘඩාංග ශිල්පී<br>■ පරිගණක ප්‍රකාශන ශිල්පී (Desktop publisher)<br>■ පරිගණක ජාලකරණ ශිල්පී<br>(ඉහත පාඨමාලාවලින් එකක් සඳහා NVQ මට්ටම් 3/4 සහතික ලබා තිබීම;<br>හෝ<br>කලා විෂය ධාරාවේ දෘඪ තාක්ෂණය (Hard Technology) යටතේ වූ තොරතුරු තාක්ෂණය (ICT) විෂයට සම්මාන සාමාර්ථයක් සහිතව විෂයයන් තුනක් සමත්වීම. |

**තොරතුරු සන්නිවේදන හා බහුමාධ්‍ය තාක්ෂණ ක්ෂේත්‍රය**

*අර්ධ කාල පාඨමාලා*

| *අනු. අංකය* | *පාඨමාලා සංකේත අංකය* | *පාඨමාලාවේ නම හා ස්වභාවය* | *පැවැත්වෙන තාක්ෂණ/ කාර්මික විද්‍යාලය* | *ඇතුලත්වීමේ සුදුසුකම් පූර්ණ කාලීන පාඨමාලා වයස අවුරුදු 17ත් 29ත් අතර විය යුතුය. අර්ධ කාලීන පාඨමාලා වයස අවුරුදු 17 ට වැඩි විය යුතුය.* |
|---|---|---|---|---|
| 26 | ETB 11.1 | තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය පිළිබඳ ජාතික ඩිප්ලෝමාව<br><br>**NVQ** මට්ටම් **5**<br><br>සති අන්ත/අර්ධ කාල<br>(NVQ Level - 5 සඳහා නියමිත පැය ගණන)<br><br>(පදනම් පාඨමාලාවක් ද ඇතුළත්ය) | <u>ඉංග්‍රීසි මාධ්‍යය</u><br><br>අනුරාධපුරය<br>ගාල්ල<br>යාපනය<br>මහනුවර<br>මරදාන<br>රත්නපුර | ■තොරතුරු සන්නිවේදන තාක්ෂණ ශිල්පී<br>■ පරිගණක යෙදවුම් සහායක<br>■පරිගණක චිත්‍රකරණය ශිල්පී<br>■පරිගණක දෘඩාංග ශිල්පී<br>■පරිගණක ප්‍රකාශන ශිල්පී (Desktop publisher)<br>■පරිගණක ජාලකරණ ශිල්පී)<br>ඉහත පාඨමාලාවලින් එකක් සඳහා NVQ මට්ටම් 3/4 සහතික ලබා තිබීම. |

## ලෝහ හා මෘදු ලෝහ ඉංජිනේරු ක්ෂේත්‍රය

### පූර්ණ කාල පාඨමාලා

| අනු. අංකය | පාඨමාලා සංකේත අංකය | පාඨමාලාවේ නම හා ස්වභාවය | පැවැත්වෙන තාක්ෂණ/ කාර්මික විද්‍යාලය | ඇතුලත්වීමේ සුදුසුකම් පූර්ණ කාලීන පාඨමාලා වයස අවුරුදු 17ත් 29ත් අතර විය යුතුය. අර්ධ කාලීන පාඨමාලා වයස අවුරුදු 17 ට වැඩි විය යුතුය. |
|---|---|---|---|---|
| 27 | ETB 12 | පැස්සුම් තාක්ෂණය පිළිබඳ ජාතික ඩිප්ලෝමාව<br><br>**NVQ** මට්ටම් **5**<br><br>පූර්ණ කාල දිවා අවුරුදු 1 1/2<br><br>(පදනම් පාඨමාලාවක් ද ඇතුළත්ය.) | **<u>ඉංග්‍රීසි මාධ්‍යය</u>**<br>මරදාන<br>කුරුණෑගල | ➢ පැස්සුම්කරු<br>➢ ලෝහ පිරිසකරකරු<br>➢ මෝටර් වාහන වැද්දුම් ශිල්පී<br>➢ වැද්දුම්කරු / යන්ත්‍ර ශිල්පී<br><br>ඉහත පාඨමාලාවලින් එකක් සඳහා NVQ මට්ටම් 3/4 සහතික ලබා තිබීම;<br>හෝ<br>අ.පො.ස (සා.පෙළ.) සම්මාන 04ක් සහිතව විෂයයන් 06ක් සමත් වීම. (ගණිතය සහ විද්‍යාව සමත්වීම අනිවාර්ය වේ.)<br><br>(උසස් පෙළ හැදෑරූ සිසුන් කෙරෙහි ප්‍රමුඛතාවය ලබා දෙනු ලැබේ.) |
| 28 | ETB 16 | නිෂ්පාදන තාක්ෂණය පිළිබඳ ජාතික ඩිප්ලෝමාව<br><br>**NVQ** මට්ටම් **5**<br><br>පූර්ණ කාල දිවා අවුරුදු 1 1/2<br><br>(පදනම් පාඨමාලාවක් ද ඇතුළත්ය.)<br><br>(This course includes the Technology related to Designing of Machine Components, Manufacturing Drawings, Analyzing of Product's quality, computer numerical, control machines and engineering materials) | **<u>ඉංග්‍රීසි මාධ්‍යය</u>**<br>මහනුවර<br>මරදාන | ➢ ඇළුමිනියම් පිරිසකර කරන්නා<br>➢ යන්ත්‍ර ශිල්පී<br>➢ ආවුධ සහ අච්චු තැනීමේ ශිල්පී<br>➢ පැස්සුම් ශිල්පී<br>➢ ලෝහ පිරිසකරකරු<br>➢ වැද්දුම්කරු<br><br>ඉහත පාඨමාලාවලින් එකක් සඳහා NVQ මට්ටම් 3/4 සහතික ලබා තිබීම;<br>හෝ<br>අ.පො.ස.(උ.පෙළ) ඉංජිනේරු තාක්ෂණවේදය/ගණිත/විද්‍යා යන විෂයධාරාවන්ගෙන් අවම වශයෙන් විෂයන් තුනක් සමත් වීම. (උසස් පෙළ ඉංජිනේරු තාක්ෂණවේදය හැදෑරූ සිසුන් කෙරෙහි ප්‍රමුඛතාවය ලබා දෙනු ලැබේ.);<br><br>හෝ<br><br>කලා විෂය ධාරාවේ දෘඩ තාක්ෂණය (Hard Technology) යටතේ වූ යාන්ත්‍රික තාක්ෂණය (Mechanical Technology) විෂයට සම්මාන සාමාර්ථයක් සහිතව විෂයන් තුනක් (03) සමත්වීම. |

**ලෝහ හා මෘදු ලෝහ ඉංජිනේරු ක්ෂේත්‍රය**

*අර්ධ කාල පාඨමාලා*

| *අනු. අංකය* | *පාඨමාලා සංකේත අංකය* | *පාඨමාලාවේ නම හා ස්වභාවය* | *පැවැත්වෙන තාක්ෂණ/ කාර්මික විද්‍යාලය* | *ඇතුලත්වීමේ සුදුසුකම් පූර්ණ කාලීන පාඨමාලා වයස අවුරුදු 17ත් 29ත් අතර විය යුතුය. අර්ධ කාලීන පාඨමාලා වයස අවුරුදු 17 ට වැඩි විය යුතුය.* |
|---|---|---|---|---|
| 29 | ETB 12.1 | පෑස්සුම් තාක්ෂණය පිළිබඳ ජාතික ඩිප්ලෝමාව<br><br>**NVQ** මට්ටම් **5**<br><br>සති අන්ත/අර්ධ කාල (NVQ Level - 5 සඳහා නියමිත පැය ගණන)<br><br>(පදනම් පාඨමාලාවක්ද ඇතුළත්ය.) | **<u>ඉංග්‍රීසි මාධ්‍යය</u>**<br>මරදාන | ➢ පෑස්සුම්කරු<br>➢ ලෝහ පිරිසකරකරු<br>➢ මෝටර් වාහන වෑද්දුම් ශිල්පී<br>➢ වෑද්දුම්කරු/ යන්ත්‍ර ශිල්පී<br><br>ඉහත පාඨමාලාවලින් එකක් සඳහා NVQ මට්ටම් 3/4 සහතික ලබා තිබීම. |

**ආහාර තාක්ෂණ ක්ෂේත්‍රය**

*පූර්ණ කාල පාඨමාලා*

| *අනු. අංකය* | *පාඨමාලා සංකේත අංකය* | *පාඨමාලාවේ නම හා ස්වභාවය* | *පැවැත්වෙන තාක්ෂණ/ කාර්මික විද්‍යාලය* | *ඇතුලත්වීමේ සුදුසුකම් පූර්ණ කාලීන පාඨමාලා වයස අවුරුදු 17ත් 29ත් අතර විය යුතුය. අර්ධ කාලීන පාඨමාලා වයස අවුරුදු 17 ට වැඩි විය යුතුය.* |
|---|---|---|---|---|
| 30 | ETA 20 | ආහාර තාක්ෂණය පිළිබඳ ජාතික ඩිප්ලෝමාව<br><br>**NVQ 5** සහ 6 මට්ටම් ඒකබද්ධව පවතී<br><br>පූර්ණ කාල දිවා අවුරුදු 2 1/2<br><br>(පදනම් පාඨමාලාවක් ද ඇතුළත්ය.)<br><br>(This course includes the subjects of analytical Chemistry, Biotechnology, Nutrition, Quality Control, and Food Safety, Management for Selection, Preservation, Processing, Packaging, Distribution, and Use of Safe Food) | **<u>ඉංග්‍රීසි මාධ්‍යය</u>**<br>මහනුවර | ➢ බේකරි ශිල්පී<br>➢ පළතුරු සහ එළවළු සැකසුම් ශිල්පී<br>➢ සූපවේදී<br><br>ඉහත පාඨමාලාවලින් එකක් සඳහා NVQ මට්ටම් 3/4 සහතික ලබා තිබීම;<br>හෝ<br>අ.පො.ස.(උ.පෙළ) ජෛව තාක්ෂණවේදය / විද්‍යාව යන විෂයධාරාවන්ගෙන් අවම වශයෙන් විෂයයන් තුනක් සමත් වීම. (උසස් පෙළ ජෛව තාක්ෂණවේදය හැදෑරූ සිසුන් කෙරෙහි ප්‍රමුඛතාවය ලබා දෙනු ලැබේ.)<br>හෝ<br>කලා විෂය ධාරාවේ මෘදු තාක්ෂණය ( Soft Technology) යටතේ වූ ආහාර තාක්ෂණය (Food Technology) කෘෂි තාක්ෂණය - (Agro Technology) යන විෂයයන්ගෙන් එක් විෂයයක් සඳහා සම්මාන සමාර්ථයක් සහිතව විෂයයන් තුනක් (03) සමත්වීම. |

| | | | | |
|---|---|---|---|---|
| 31 | ETB 14 | ආහාර තාක්ෂණය පිළිබඳ ජාතික ඩිප්ලෝමාව<br><br>**NVQ මට්ටම් 5**<br><br>පූර්ණ කාල දිවා අවුරුදු 1 1/2<br><br>(පදනම් පාඨමාලාවක් ද ඇතුළත් ය.)<br><br>(This course includes the subjects of analytical Chemistry, Biotechnology, Nutrition, Quality Control, and food Safety Management for Selection, Preservation, Processing, Packaging, Distribution, and Use of Safe Food) | <u>**ඉංග්‍රීසි මාධ්‍යය**</u><br>මහනුවර<br>කුලියාපිටිය | ➢ බේකරි ශිල්පී<br>➢ පළතුරු සහ එළවළු සැකසුම් ශිල්පී<br>➢ සූපවේදී<br>ඉහත පාඨමාලාවලින් එකක් සඳහා NVQ මට්ටම් 3/4 සහතික ලබා තිබීම;<br>හෝ<br>අ.පො.ස.(උ.පෙළ) ජෛව තාක්ෂණවේදය / විද්‍යා/කෘෂි විද්‍යා යන විෂයධාරාවන්ගෙන් අවම වශයෙන් විෂයයන් තුනක් සමත් වීම. (උසස් පෙළ ජෛව තාක්ෂණවේදය හැදෑරූ සිසුන් කෙරෙහි ප්‍රමුඛතාවය ලබා දෙනු ලැබේ.)<br>හෝ<br>කලා විෂය ධාරාවේ මෘදු තාක්ෂණ (Soft Technology) යටතේ වූ ආහාර තාක්ෂණය (Food Technology) කෘෂි තාක්ෂණය - (Agro Technology) යන විෂයයන්ගෙන් එක් විෂයක් සඳහා සම්මාන සමාර්ථයක් සහිතව විෂයයන් තුනක් (03) සමත්වීම. |

**මැණික් හා ස්වර්ණාභරණ ක්ෂේත්‍රය**

*පූර්ණ කාල පාඨමාලා*

| *අනු. අංකය* | *පාඨමාලා සංකේත අංකය* | *පාඨමාලාවේ නම හා ස්වභාවය* | *පැවැත්වෙන තාක්ෂණ/ කාර්මික විද්‍යාලය* | *ඇතුළත්වීමේ සුදුසුකම් පූර්ණ කාලීන පාඨමාලා වයස අවුරුදු 17ත් 29ත් අතර විය යුතුය. අර්ධ කාලීන පාඨමාලා වයස අවුරුදු 17 ට වැඩි විය යුතුය.* |
|---|---|---|---|---|
| 32 | ETB 15 | ස්වර්ණාභරණ නිර්මාණය හා නිෂ්පාදන තාක්ෂණය පිළිබඳ ජාතික ඩිප්ලෝමාව<br><br>**NVQ මට්ටම් 5**<br><br>පූර්ණ කාල දිවා අවුරුදු 1 1/2<br><br>(පදනම් පාඨමාලාවක් ද ඇතුළත් ය.)<br><br>(This course includes developing design Concepts, Technical Drawing and Production Creation, Modern Designing, Quality Checking.) | <u>**ඉංග්‍රීසි මාධ්‍යය**</u><br>මරදාන | ➢ ස්වර්ණාභරණ සාදන්නා<br>➢ ස්වර්ණාභරණ ගල් බැඳුම් ශිල්පී<br><br>ඉහත පාඨමාලාවලින් එකක් සඳහා NVQ මට්ටම් 3/4 සහතික ලබා තිබීම;<br>*හෝ*<br>අ.පො.ස.(උ.පෙළ) ඉංජිනේරු තාක්ෂණවේදය /විද්‍යා / කලා යන විෂයධාරාවන්ගෙන් අවම වශයෙන් විෂයයන් තුනක් සමත් වීම. |

**මුදල් හා බැංකු කළමණාකරන ක්ෂේත්‍රය**

*පූර්ණ කාල පාඨමාලා*

| *අනු. අංකය* | *පාඨමාලා සංකේත අංකය* | *පාඨමාලාවේ නම හා ස්වභාවය* | *පැවැත්වෙන තාක්ෂණ/ කාර්මික විද්‍යාලය* | *ඇතුලත්වීමේ සුදුසුකම් පූර්ණ කාලීන පාඨමාලා වයස අවුරුදු 17ත් 29ත් අතර විය යුතුය. අර්ධ කාලීන පාඨමාලා වයස අවුරුදු 17 ට වැඩි විය යුතුය.* |
|---|---|---|---|---|
| 33 | BSA 01 | ගිණුම්කරණය පිළිබඳ ජාතික ඩිප්ලෝමාව<br><br>NVQ 5 සහ 6 මට්ටම් ඒකාබද්ධව පවතී.<br><br>පූර්ණ කාල දිවා දෑවුරුදු<br><br>(පදනම් පාඨමාලාවක් ද ඇතුළත් ය.)<br><br>(This course includes subjects related to Accounting, Costing, Auditing, Taxation Management and other related subjects.) | <u>ඉංග්‍රීසි මාධ්‍යය</u><br>අම්පාර<br>ගාල්ල<br>මහනුවර<br>කුරුණෑගල<br>මරදාන<br>මඩකලපුව<br>කෑගල්ල<br>සමන්තුරය<br>කුලියාපිටිය<br><u>සිංහල මාධ්‍යය</u><br>අම්පාර<br>ගාල්ල<br>මහනුවර<br>කුරුණෑගල<br>මරදාන<br>හෝමාගම<br>බෙලිඅත්ත<br>කෑගල්ල<br>මාතර<br>කුලියාපිටිය<br><u>දෙමළ මාධ්‍යය</u><br>යාපනය<br>වව්නියාව<br>අක්කරෙයිපත්තුව | අ.පො.ස.(සා.පෙළ) විභාගයෙන් ගණිතය සහ ඉංග්‍රීසි විෂය ඇතුළුව විෂයයන් හයකින් (06) සමත්වීම;<br>*සහ*<br>අ.පො.ස (උ.පෙළ) විභාගයෙන් ගණකාධිකරණය, සංයුක්ත ගණිතය, ව්‍යාපාර අධ්‍යයනය, ආර්ථික විද්‍යාව, ව්‍යාපාර සංඛ්‍යානය යන විෂයයන් අතුරින් එකක් (01) සහිතව විෂයයන් තුනකින් (03) සමත්වීම;<br>*හෝ*<br>කාර්මික අධ්‍යාපන හා පුහුණුකිරීමේ දෙපාර්තමේන්තුවේ තාක්ෂණ / කාර්මික විද්‍යාලයන්හි පැවැත්වෙන ගණක ශිල්පීන් සඳහා වූ ජාතික සහතික පත්‍ර පාඨමාලාව හදාරා සමත්ව තිබීම. |

**අධ්‍යාපන ක්ෂේත්‍රය**

*පූර්ණ කාල පාඨමාලා*

| *අනු. අංකය* | *පාඨමාලා සංකේත අංකය* | *පාඨමාලාවේ නම හා ස්වභාවය* | *පැවැත්වෙන තාක්ෂණ/ කාර්මික විද්‍යාලය* | *ඇතුලත්වීමේ සුදුසුකම් පූර්ණ කාලීන පාඨමාලා වයස අවුරුදු 17ත් 29ත් අතර විය යුතුය. අර්ධ කාලීන පාඨමාලා වයස අවුරුදු 17 ට වැඩි විය යුතුය.* |
|---|---|---|---|---|
| 34 | ETB19 | ඉංග්‍රීසි සහ අධ්‍යාපනය පිළිබඳ ඩිප්ලෝමාව (Diploma in English and Education)<br><br>**NVQ** මට්ටම් **5**<br><br>පූර්ණකාල දිවා අවුරුදු 1 | <u>ඉංග්‍රීසි මාධ්‍යය</u><br>අම්පාර<br>ගාල්ල<br>යාපනය<br>කුරුණෑගල<br>මරදාන<br>බෙලිඅත්ත<br>කළුතර<br>කුලියාපිටිය<br>මාතර<br>සමන්තුරේ<br>වවුනියාව | උසස් වෘත්තීය කුසලතාව පිළිබඳ ඉංග්‍රීසි (NVQ Level 4) සහතිකය. (Advancing Career Skills NVQ Level 4)<br>*හෝ*<br>වාණිජ කර්මාන්ත සඳහා ඉංග්‍රීසි ජාතික සහතිකය ලබා තිබීම (NCE).<br>*හෝ*<br>වෘත්තීය ඉංග්‍රීසි ජාතික සහතිකය ලබා තිබීම (NCPE) .<br>*හෝ*<br>රැකියා අපේක්ෂිතයින් සඳහා ඉංග්‍රීසි පාඨමාලාව හදාරා සහතිකය ලබා තිබීම. (CJS) |

| *අනු. අංකය* | *පාඨමාලා සංකේත අංකය* | *පාඨමාලාවේ නම හා ස්වභාවය* | *පැවැත්වෙන තාක්ෂණ/ කාර්මික විද්‍යාලය* | *ඇතුලත්වීමේ සුදුසුකම් පූර්ණ කාලීන පාඨමාලා වයස අවුරුදු 17ත් 29ත් අතර විය යුතුය. අර්ධ කාලීන පාඨමාලා වයස අවුරුදු 17 ට වැඩි විය යුතුය.* |
|---|---|---|---|---|
| | | | | *හෝ*<br>අ.පො.ස (උ.පෙළ) විභාගයෙන් සාමාන්‍ය ඉංග්‍රීසි (General English) විෂයට සාමාර්ථයක් සහිතව විෂයයන් තුනකින් (03) සමත්වීම. |
| 35 | ETA 23 | ඉංග්‍රීසි සහ අධ්‍යාපනය පිළිබඳ උසස් ඩිප්ලෝමාව (Higher National Diploma in English and Education)<br><br>NVQ මට්ටම් 6<br><br>පූර්ණකාල දිවා අවුරුදු 1 | <u>ඉංග්‍රීසි මාධ්‍යය</u><br><br>අම්පාර<br>කුරුණෑගල<br>සමන්තුරේ | ඉංග්‍රීසි සහ අධ්‍යාපනය පිළිබඳ ඩිප්ලෝමාව (Diploma in English and Education) NVQ Level 5 පාඨමාලාව හදාරා තිබීම.<br>හෝ<br>ඉංග්‍රීසි පිළිබඳ උසස් ජාතික ඩිප්ලෝමා සහතිකය SLIATමගින් ලබා තිබීම.<br>හෝ<br>ඉංග්‍රීසි විෂය ඇතුළුව අ.පො.ස. උසස් පෙළ විෂයන් 3ක් සමත්වීම. (සාමාන්‍ය පෙළ ඉංග්‍රීසි විෂය නොවේ) |

12-603

---

**අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය**

ශ්‍රී ලංකා විදුහල්පති සේවය සඳහා වූ ඉංග්‍රීසි භාෂා පරීක්ෂණය 2018

අංක 1885/31 හා 2014.10.22 දිනැති ශ්‍රී ලංකා විදුහල්පති සේවා ව්‍යවස්ථාවට අනුව ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ නිලධාරීන් සඳහා වන ඉංග්‍රීසි භාෂා පරීක්ෂණය 2019 අප්‍රේල් මස කොළඹදී පැවැත්වෙන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

02. විදුහල්පති සේවයේ සෑම නිලධාරියෙකුම බඳවා ගැනීමේ දින සිට වසර (03) ක් ඇතුළත සන්ධාන භාෂාව පිළිබඳ ප්‍රවීණතාවය ලබා ගත යුතුය. නිලධාරියකු අ.පො.ස. (සා.පෙ) විභාගයේ දී ඉංග්‍රීසි විෂය සඳහා අවම වශයෙන් සම්මාන සාමාර්ථයක් හෝ ඊට ඉහළ සාමාර්ථයක් ලබා තිබේ නම් ඉංග්‍රීසි භාෂා පරීක්ෂණය සමත් වීමේ අවශ්‍යතාවයෙන් නිදහස් කරනු ලැබේ. සෙසු නිලධාරීන් මෙම පරීක්ෂණය සමත් විය යුතු ය.

03. මෙම විභාගයට අදාළ විෂය නිර්දේශය හා අනෙකුත් විධිවිධාන අංක 1885/31 දරන 2014.10.22 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අතිවිශේෂ ගැසට් පත්‍රයේ* පළ කර ඇත. අයදුම්කරුවන්ගේ පහසුව සඳහා එම විෂය නිර්දේශය හා අනෙකුත් විධිවිධාන පහත දක්වා ඇත.

(අ) විභාග පටිපාටිය - විෂය නිර්දේශය පහත පරිදි වේ.

(1) සාමාන්‍ය ඉංග්‍රීසි (General English)
ලකුණු 100 - කාලය පැය 03

**විෂය නිර්දේශය**

Suitable level of proficiency on the following forms of grammar in the written language is expected from the candidate:

- Tenses and Numbers
- Sentences (Simple/Compound/Complex/Compound Complex)
- Relative Clauses
- Reported Speech
- Adjectives and Adverbs
- Determiners
- Prepositions

The knowledge on the modern formats and styles of writing is tested in following area of study :-

- Summary writing
- Report writing
- Essay writing

04. සාමාර්ථය ලැබීම සඳහා මෙම විෂයයට අපේක්ෂකයකු අවම වශයෙන් 40% ක හෝ ඊට වැඩි ලකුණු ප්‍රමාණයක් ලබා ගත යුතුය.

4.1. විභාගයට පෙනී සිටි සියලුම අයදුම්කරුවන්ගේ ප්‍රතිඵල ඇතුළත් ප්‍රතිඵල ලේඛනය ලේකම්, අධ්‍යාපන අමාත්‍යාංශය වෙත ලබා දෙනු ඇත. විභාග අපේක්ෂකයින් වෙත පෞද්ගලික ප්‍රතිඵල ලේඛන නිකුත් කිරීම විභාග කොමසාරිස් ජනරාල් විසින් සිදු නොකරනු ඇත.

05. පහත දැක්වෙන ආකෘතියට අනුව, ඉල්ලුම් පත්‍රයේ අංක 01 සිට 04 තෙක් වූ ශීර්ෂ පළමුවන පිටුවටද ඉතිරිය අනෙක් පිටුවලට ද ඇතුළත් වන පරිදි ඉල්ලුම්පත්‍රය සකස් කළ යුතු අතර ඊට අදාළ තොරතුරු විභාගයට ඉල්ලුම් කරන මාධ්‍යයෙන් තම අත් අකුරින්ම පැහැදිලිව සම්පූර්ණ කළ යුතුය. සම්පූර්ණ කරන ලද ඉල්ලුම් පත්‍රයේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇති බව දන්වමි. තවද සම්පූර්ණ කරනු ලබන ඉල්ලුම් පත්‍රය විභාග නිවේදනයේ සඳහන් ආදර්ශ ඉල්ලුම් පත්‍රයට අනුකූලද යන්න පිළිබඳව අයදුම්කරු විසින් විමසා බැලිය යුතු අතර ආදර්ශ ඉල්ලුම් පත්‍රයට අනුකූල නොවන ඉල්ලුම් පත්‍ර හා අසම්පූර්ණ ලෙස තොරතුරු සඳහන් කර ඇති ඉල්ලුම් පත්‍ර දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කෙරේ. තවද ඉල්ලුම් පත්‍රය යොමු කිරීමට ප්‍රථම නියමිත විභාග ගාස්තු ගෙවා එහි විස්තර ඉල්ලුම් පත්‍රයට ඇතුළත් කොට ලදුපත අලවා ඇත්ද යන්න පිළිබඳ නැවත විමසිලිමත් විය යුතු බවත්, සම්පූර්ණ කරන ලද ඉල්ලුම් පත්‍රයේ හා විභාග ගාස්තුවට අදාළ ලදුපතේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇති බවත් දන්වමි. ඉල්ලුම් පත්‍රය පිළියෙල කර ගන්නා විට එහි ශීර්ෂයේ සඳහන් විභාගයේ නම සිංහල ඉල්ලුම් පත්‍රවල සිංහලට අමතරව ඉංග්‍රීසියෙන්ද, දෙමළ ඉල්ලුම් පත්‍රවල දෙමළට අමතරව ඉංග්‍රීසියෙන්ද යෙදීම අවශ්‍ය බව දන්වමි.

06. විභාග කොමසාරිස් ජනරාල් විසින් විභාගය පවත්වනු ලබන අතර, එය පැවැත්වීම සඳහා ඔහු විසින් පනවා ඇති නීති රීති පිළිපැදීමට අපේක්ෂකයෝ බැඳී සිටිති. විභාගය සඳහා වන නීති රීති මෙම නිවේදනය අවසානයේ පළ කොට ඇත.

07. ඉල්ලුම් පත්‍ර 2019 ජනවාරි 21 වැනි දින හෝ ඊට ප්‍රථම විභාග කොමසාරිස් ජනරාල්, සංවිධාන (ආයතනික හා විදේශ විභාග) ශාඛාව, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, තැ.පෙ. 1503, කොළඹ ලිපිනයට ලැබෙන පරිදි විදුහල්පති / කොට්ඨාස අධ්‍යාපන අධ්‍යක්ෂ / කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ හෝ අතිරේක පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ / පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ මඟින් හෝ ඔබේ සේවා ප්‍රධානියා මඟින් ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. ඉල්ලුම් පත්‍රය බහා එවන ලියුම් කවරයේ වමත් පස ඉහළ කෙළවරේ විභාගයේ නම පැහැදිළිව ලිවිය යුතු අතර මෙදිනට පසු එවනු ලබන ඉල්ලුම් පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ.

08. අයදුම්කරුවන් වෙත ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් නිවේදනයක් පුවත්පත්වල හා ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තු නිල වෙබ් අඩවියේ පළ කරනු ඇත. නිවේදනය පළ වී දින 02 ක් හෝ 03 ක් ගතවූ පසුවත් ප්‍රවේශ පත්‍රය නොලැබුණි නම් දැන්වීමේ සඳහන් ආකාරයට ඒ බව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත දන්වා සිටිය යුතුයි. එසේ දැන්වීමේදී අයදුම්කරුගේ සම්පූර්ණ නම, ලිපිනය, ජාතික හැඳුනුම්පත් අංකය හා අයදුම් කළ විභාගයේ නම සඳහන් කළ යුතුය. කොළඹින් බැහැර අයදුම්කරුවකු නම් එම විස්තර සමඟ ප්‍රවේශ පත්‍රයේ පිටපතක් එවිය හැකි ෆැක්ස් අංකයක් ද සහිත ඉල්ලීම් ලිපියක් දැන්වීමේ සඳහන් ෆැක්ස් අංකය වෙත යොමු කර විමසීම වඩාත් ඵලදායී වේ. විභාග දෙපාර්තමේන්තුවෙන් විමසන අවස්ථාවේ අවශ්‍ය වුවහොත් අයදුම්කරුගේ අපේක්ෂකත්වය තහවුරු කිරීම සඳහා තමා ළඟ තබා ගත් ඉල්ලුම් පත්‍රයේ පිටපත, විභාග ගාස්තු ගෙවීම අදාළ වේ නම් ඒ සඳහා වූ ලදුපතේ පිටපත හා ඉල්ලුම් පත්‍රය තැපැල් කිරීමේදී ලියාපදිංචි කරන ලද කුවිතාන්සිය ද සූදානමින් තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. අපේක්ෂකයකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත් වීමට සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතුය.

09. ඉල්ලුම් පත්‍රයේ ද විභාගය සඳහා වන ප්‍රවේශ පත්‍රයේ ද අයදුම්කරුගේ අත්සන ආයතන ප්‍රධානියා හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියකු ලවා සහතික කර තිබිය යුතුය. අපේක්ෂකයකු තමාට නියම කර ඇති විභාග ශාලාවේදී නියමිත විභාග අංකය යටතේ විභාගයට පෙනී සිටිය යුතු අතර විභාග දින තම අත්සන සහතික කරවා ගත් ප්‍රවේශ පත්‍රය ශාලාධිපති වෙත භාර දිය යුතුය. තම ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් නොකරන අපේක්ෂකයකුට විභාගයට පෙනී සිටීමට අවසර දෙනු නොලැබේ.

10. විභාග ශාලාවේදී තමන්ගේ අනන්‍යතාව තහවුරු කිරීම සඳහා සාක්ෂි ඉදිරිපත් කිරීම අපේක්ෂකයින්ගේ වගකීම වේ. ඒ සඳහා,

(i) ජාතික හැඳුනුම්පත හෝ,
(ii) වලංගු විදේශ ගමන් බලපත්‍රය හෝ,
(iii) වලංගු රියදුරු බලපත්‍රය හෝ,
පමණක් පිළිගනු ලැබේ.

11. විභාග ගාස්තු :

(*අ*) මෙම විභාගය සඳහා අයකරන ලද ගාස්තු මොනයම් හේතුවක් මත හෝ ආපසු ගෙවනු නොලබන අතර වෙනත් විභාගයක ගාස්තුවකට මාරු කිරීමටද ඉඩ දෙනු නොලැබේ. තවද විභාග ගාස්තුව සඳහා මුදල් ඇණවුම් හෝ මුද්දර භාරගනු නොලබන අතර විභාග ගාස්තු ගෙවන ලද ලදුපතේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

(*ආ*) පළමුවැනි වතාවේදී ගාස්තු අයකරනු නොලැබේ.

(*ඇ*) ඊට පසු එක් එක් වතාව සඳහා රු. 250 බැගින් අය කරනු ලැබේ.

මෙම විභාග ගාස්තුව විභාග කොමසාරිස් ජනරාල්ගේ ආදායම් ශීර්ෂ 20-03-02-13 ට බැරවන ලෙස දිවයිනේ පිහිටි ඕනෑම තැපැල් කාර්යාලයකට ගෙවා ලබා ගන්නා ලදුපත ඉල්ලුම් පත්‍රයේ නියමිත ස්ථානයේ නොගැලවෙන සේ අලවා එවිය යුතුය. ලදුපතේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

12. විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීති වලට විභාග අපේක්ෂකයින් යටත් වේ. එම නීතිරීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට හෝ ඇයට සිදුවනු ඇති බව දන්වමි.

13. සිංහල, ඉංග්‍රීසි හා දෙමළ මාධ්‍යයන්ගෙන් පළවන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් නොගැලපීමක් හෝ අනනුකූලතාවක් ඇති බව පෙනී යන්නේ නම් එවැනි අවස්ථාවක සිංහල මාධ්‍ය නිවේදනයට අනුව කටයුතු කරනු ලැබේ.

14. තවද මෙම නිවේදනය මගින් ආවරණය නොවන කිසියම් කාරණයක් වෙතොත් ඒ පිළිබඳව තීරණය කිරීමේ අයිතිය අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්වරයා සතුය.

පද්මසිරි ජයමාන්න,
ලේකම්,
අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය.

2018 දෙසැම්බර් මස 04 වැනි දින,
පැලවත්ත, ඉසුරුපාය, අධ්‍යාපන අමාත්‍යාංශයේ දී ය.

*ආදර්ශ ඉල්ලුම් පත්‍රය*

**ශ්‍රී ලංකා විදුහල්පති සේවය සඳහා වූ ඉංග්‍රීසි භාෂා පරීක්ෂණය - 2018**
**English Language Test for the Sri Lanka Principals Service – 2018**

(විදුහල්පති/ කොට්ඨාස හෝ කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ/ අතිරේක පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ/ පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ මඟින් විභාග කොමසාරිස් ජනරාල්, සංවිධාන (ආයතනික හා විදේශ විභාග) ශාඛාව, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, තැ. පෙ. 1503, කොළඹ. වෙත ලියාපදිංචි තැපෑලෙන් ඉදිරිපත් කරන්න. විභාගයේ නම කවරයේ වමත් පස ඉහළ කෙළවරේ සඳහන් කළ යුතුය.)

1. (අ) මුලකුරු අගය යොදා මුලකුරු සමඟ නම :————.
(මුල් අකුරු සමඟ ඉංග්‍රීසි කැපිටල් අකුරින්) උදා :- (GUNAWARDHANA, M.G.B.S.K) :————.
(ආ) සම්පූර්ණ නම (සිංහලෙන්/දෙමළෙන්) :————.

2. ලිපිනය
(i) පෞද්ගලික :————.
(ii) රාජකාරී :————.
(iii) ප්‍රවේශපත්‍රය එවිය යුතු ලිපිනය :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරින්)

3. (i) ස්ත්‍රී/පුරුෂ භාවය
ස්ත්‍රී - 1
පුරුෂ - 0
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

(ii) ජාතික හැඳුනුම්පත් අංකය :

(iii) උපන් දිනය : වර්ෂය මාසය දිනය

4. දුරකතන අංකය :
i. ජංගම -
ii. ස්ථාවර -

5. විදුහල්පති සේවයේ පන්තිය/ශ්‍රේණිය :————.
පාසල / කාර්යාලය :————.
පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව/කලාප අධ්‍යාපන කාර්යාලය :————.

6. විභාග ගාස්තු ගෙවා ලබා ගත් ලදුපතේ විස්තර :
ලදුපත් අංකය :————.
තැපැල් කාර්යාලය :————.
දිනය :————.

ලදුපත මෙහි අලවන්න

ඉහත සඳහන් තොරතුරු නිවැරදි බව ප්‍රකාශ කරමි. තවද විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීති වලට මා එකඟ වෙමි.

————,
ඉල්ලුම්කරුගේ අත්සන

දිනය :————.

විභාග කොමසාරිස් ජනරාල්,

ඉහත විස්තර දක්වෙන අපේක්ෂකයා මගේ පාසලේ / කාර්යාලයේ නිලධාරියකු බව සහතික කරමි. තවද අපේක්ෂකයා විභාග ගාස්තුවෙන් නිදහස් බවද/ අපේක්ෂකයා විභාග ගාස්තු සඳහා වන ලදුපත නිවැරදිව අලවා ඇති බව ද සහතික කරමි.

.....................................................
විදුහල්පතිගේ/ කොට්ඨාස හෝ කලාප අධ්‍යාපන අධ්‍යක්ෂකගේ/
අතිරේක පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂකගේ / පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂකගේ අත්සන.

(විදුහල්පතිවරයකු නම් පාසලේ නම සඳහන් කරන්න)
(නිල මුද්‍රාවෙන් සනාථ කරන්න)

ලිපිනය :————.
දිනය :————.
(අදාළ නොවන වචන කපා හරින්න)

12-628

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.